**ශීර්ෂය 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය **206 -** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- |
| 1.2.1 | දෙපාර්තමේන්තුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කළ යුතුය. | 1.6.1 (ආ) i |
| 1.2.2 (අ) i | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනසක් තිබේ නම් එම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (අ) |
| 3.2.4. iv | කොන්ත්‍රාත්කරු වෙත නැවත ගෙවූ ප්‍රමාද ගාස්තු ආපසු අය කර ගැනීමට පියවර ගත යුතු යුතුය. | 2.5. i |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර රු.444,761 ක වෙනසක් පැවතුණු අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනස වසර 20 කට පෙර සිට පැවත එන අතර, අදාල ලිපි ලේඛන සොයාගැනීමේ දුෂ්කරතාවයක් පවතී. දැනට පැරණි ලිපිලේඛන සොයා ගැනීමට කටයුතු කරමින් පවතින අතර, මෙම වෙනස හඳුනාගත් වහාම විගණනයට වාර්තා කිරීමට කටයුතු කෙරේ. | අත්තිකාරම් පාලන ගිණුම හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව ශේෂයේ වෙනසක් තිබේ නම් එම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ---------------- |
| (i) | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළයුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගෙන නොහැකි නම් තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු වූවත් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි 05 ක්, තක්සේරු අගය රු.5,000,000 ක් වූ වාහන 02ක් හා හෙක්ටයාර් 1.4157 ක් වූ ඉඩම් 04 ක් 2022 දෙසැම්බර් 31 වන විටද ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු රථවාහන සියල්ල තක්සේරු කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශයට අයත් KD 1857 හා KD 1874 දරණ මෝටර් රථ දෙක පවරා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති අතර, අදාල එකගතාවය ලද පසු ගිණුම්ගත කිරීම් සිදු කෙරේ. උතුරු දකුණු මිතුරු සෙවන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩමෙහි අයිතිය පවරා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් මිහින්තලය වෙත ඉල්ලීමක් කර ඇත. අනෙකුත් ඉඩම් වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු අවසන් වූ වහාම වත්කම් ගිණුම්ගත කිරීම සිදු කෙරේ. | දෙපාර්තමේන්තුවට අයත් සියලු මූල්‍ය නොවන වත්කම් හඳුනාගත පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | එකතුව රු.1,210,000 කට තක්සේරු කරන ලද වාහන 02 ක වටිනාකම රු.210,000 ක් අඩුවෙන් රු.1,000,000 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | මෙම වාහන දෙකෙහි කාලය වර්ෂ 5 ඉක්මවා නොතිබූ බැවින් තක්සේරු වටිනාකම ඇතුළත් නොකරන ලදි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ------------- |
| දෙපාර්තමේන්තුව තුළ නැටුම් ශිල්පීන් 47 දෙනෙකුගෙන් සමන්විත නැටුම් කණ්ඩායමක් සිටියදීත් බාහිර නැටුම් ශිල්පීන් 28 දෙනෙකු සඳහා රු.285,000 ක් ගෙවා තිබුණි. | මෙම ශිල්පීන්ගේ දක්ෂතාවයන් දෙස බැලූ විට ඔවුන්ගෙන් ඇතමෙක් දක්ෂ වන්නේ එක් නර්තන සම්ප්‍රදායකට පමණි. ඒ අනුව නර්තනාංග නිර්මාණය කිරීමේ දී, එහි අලංකාරය පවත්වා ගැනීමට නම් වැඩි ශිල්පීන් ප්‍රමාණයක් අවශ්‍ය වේ. එවිට රාජ්‍ය නර්තන කණ්ඩායමට පරිබාහිර ශිල්පීන්ගේ සේවාව ලබා ගැනීමට සිදුවේ. | දෙපාර්තමේන්තු තුළ සිටින නැටුම් ශිල්පීන්ගේ හැකියාවන් වර්ධනය කරගත යුතු අතර ඔවුන්ගේ සේවය ලබා ගත යුතුය. |

### 2.2 අධිවැය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ------------- |
| කෙටි චිත්‍රපට උළෙල සඳහා ඇස්තමේන්තුගත වියදම ඉක්මවා අයිතම් 05 ක් වෙනුවෙන් එකතුව රු.381,241 ක් වැඩියෙන් වැයකර තිබුණි. | ඇස්තමේන්තු සැකසීමේ දී තිබූ මිළ ගණන් සාපේක්ෂව ඉහළ යාම මත වියදම් වැඩි වී ඇත. | වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 05 කට අදාලව එකතුව රු.2,275,864 ක ශේෂයක් දක්වා තිබුණද එකී බැරකම්වලට අමතරව 2023 ජනවාරි හා පෙබරවාරි මාසයන්හි 2022 වර්ෂයට අදාලව වැය විෂයයන් 10 ක් යටතේ එකතුව රු.8,841,820 ක් ගෙවා තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් රු.6,565,956 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ බැදීම් හා බැරකම් ලේඛනය සකස් කිරීමේ දී, ඒ සඳහා අදාල තොරතුරු සියළුම අභ්‍යන්තර අංශ වෙතින් ගෙන්වා ගත් අතර, ඒ වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ බිල්පත් පදනම් කර ගෙන සකසන ලදි. | සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5, 4.6 උපවගන්ති හා 2019 ජුනි 27 දිනැති අංක 5/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ) හා 4 ඡේදය** | වසර 05 ක කාලය ඉක්මවා ඇති සේවය හැරගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.204,039 ක්වූ ණය ශේෂ හා හඳුනා නොගත් නිලධාරින් 6 දෙනෙකුගෙන් අයවිය යුතු රු.23,923 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවය හැර ගිය නිලධාරීන් අතුරෙන් 04 දෙනෙකුගේ පදිංචිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මගින් විමසා ඇත. තිදෙනෙකු පිළිබඳ තොරතුරු ලැබී ඇත. තවදුරටත් කටයුතු කරමින් පවතී.හඳුනානොගත් නිලධාරීන් සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු සොයමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 අවිධිමත් ගනුදෙනු**

**(i) අධිකාර බලය නොමැති ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | --------------------------------- | ------------- |
| ජෝන්ද සිල්වා සමරු රඟහල අදියර-I, වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කර ගොඩනැඟිල්ල භාර දී තිබුණද ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණු රු.38,658,734 ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම මුදල ගෙවීම සඳහා නිසි අධිකාරි බලයකින් හා අනුමැතියකින් තොරව දෙවන අදියරේ ප්‍රතිපාදන මුදලින්ද රු.8,512,971 ක් ලබා දී තිබුණි. | ශ්‍රී පාලී කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් රු.38,658,733.68 ක අන්තර්වාර බිල්පතක් ඉදිරිපත් කරන ලදුව එම මුළු මුදල වෙනුවෙන් රික්විසිෂන් පත්‍රයක් නිකුත් කර ඇතත් පොදු තැන්පත් ගිණුමෙහි ඇති රු.30,145,763.01 ක මුදල අඩු කිරීමෙන් පසු ඉතිරි රු.8,512,970.67 ක මුදල 2019 වර්ෂයේ අයවැයෙන් වෙන් කරන ලද රු.මිලියන 700 ක මුදලින් ගෙවා ඇත. | කොන්ත්‍රාත්කරු වෙත නැවත ගෙවූ ප්‍රමාද ගාස්තු ආපසු අය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | -------------- |
| 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් වැය විෂය යටතේ සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් දැක්වීමේදී ඊට අදාළ භෞතික ඉලක්ක දක්වා නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක.02/2020 හි දැක්වෙන ආකාරයට ආකෘතියේ භෞතික ඉලක්ක දැක්වීමට සඳහන් කර නොමැති බැවින් එය ඇතුළත් නොකළ අතර, ඉදිරි වර්ෂයේ සිට එය ඇතුළත් කිරීමට කටයුතු කරමි. | ක්‍රියාකාරි සැලැස්මෙහි අවශ්‍යය තොරතුරු දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------- | -------------- |
| ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ 2022 වසරේ තෝරාගත් පොත් මිලදී ගැනීම සඳහා රු.4,300,000 ක මුදලක් වැය කර තිබු අතර භාෂා 03 න් පොත් 10,313 ක් මිලදීගෙන තිබුණද මිලදී ගත් පොත්වලින් වර්ෂය තුළ 8,949ක් බෙදාහැර නොතිබුණි. ඊට අමතරව 2018 වර්ෂයට පෙර සිට 2021 වර්ෂය දක්වා මිලදී ගත් පොත් 6914 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට බෙදා නොහැර ගබඩාව තුළ පැවතුණි. | 2022 වර්ෂයට පෙර පොත් බෙදාහැරීම පිළිබඳව නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබූ බැවින් වර්තමානයේ සිට ඉහත ක්‍රමවේදය යටතේ පොත් බෙදාහැරීම කෙරේ. 2022 වර්ෂයේ පොත් ගබඩාව ස්ථානීය වෙනසක් සිදු වූ අතර, එම පොත් නැවත අසුරා ගන්නා තෙක් තාවකාලිකව පොත් බෙදාහැරීම අත්හිටුවන ලදි. පුස්තකාල ඉල්ලීම් ද විවිධ වන බැවින් පොත් නිකුත් කිරීමේ දී එකම වර්ගයේ පොත් විශාල සංඛ්‍යාවක් නිකුත් නොකෙරේ. ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ මිල දී ගන්නා පොත්, අලෙවිය සඳහා නිකුත් නොකෙරේ. | සැලසුම් කළ පරිදි මිලදී ගත් පොත් බෙදැහැරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය නොවන වත්කම් ලෙස රු.1,382,824,759ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද කාර්යසාධන වාර්තාවේ මූල්‍ය නොවන වක්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය යටතේ රු. 958,588,668ක් එනම් රු. 424,236,091ක් අඩුවෙන් වාර්තා කර තිබුණි. තවද, සියයට 30 – 100ත් අතර ප්‍රතිශතයක් ලෙස දැක්වුණු වාර්තා කිරීමේ ප්‍රගතිය නිවැරදි නොවන බවද නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් වල එකතුව නිවැරදි වන අතර, කාර්ය සාධන වාර්තාවේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය යටතේ ප්‍රමාදදෝෂයකින් රු.343,105,266.24 ක්ද, රු.80,875,034.90 ක් සහ රු.255,790/- ක් වන මූල්‍ය නොවන වත්කම් ඇතුළත් වී නොමැති අතර, කෙටුම්පත් කාර්යසාධන වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | කාර්යසාධන වාර්තාවේ තොරතුරු නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | **ජෝන්ද සිල්වා සමරු රඟහල අලුත්වැඩියා කිරීම (වැය විෂය 206-2-3-15-2104)** | | |
| (අ) | මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් වන රු.මිලියන 311 ක් අත්තිකරම් ලෙස ගෙවා තිබුණද දැනට නිමකර ඇති ඉදිකිරිම් ප්‍රමාණය රු.මිලියන 86 ක් පමණක් බව ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය විය. | ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී මේ පිළිබඳව කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. | ගිවිසුම් අනුව ඉදිකිරීම් නිසි පරිදි ඉටු කරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 09 වන විට නිමකර බාර දීමට කටයුතු කළ යුතු වුවත් 2023 වර්ෂයේ අප්‍රේල් වන විටත් අලුත්වැඩියා කටයුතු නිම කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු පියවර ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 09 දින අවසන් කර භාර දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම් සලකා බලා උපදේශන සේවා ආයතනය විසින් 2023.04.30 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර ඇති අතර, ඉදිරියේ දී මේ පිළිබඳව උපදේශන සේවා ආයතනය විසින් කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු සිදු කරනු ඇත. | ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට අලුත්වැඩියා කටයුතු ඉටුකර ගත යුතුය. |
| (ඇ) | ගිවිසුම්ගත කාලය තුළ නවීකරණය කටයුතු නිම නොකිරීම නිසා නාට්‍යකරුවන් විශාල පිරිසකට ඔවුන්ගේ පුහුණුවීම් කටයුතු සිදුකිරීමට නොහැකි වීම,නාට්‍ය පැවැත්වීමට නොහැකිවීම නිසා ආදායම් ඉපැයීමේ කටයුතු ඇනහිටීමත් හේතුවෙන් රජයේ ආදායමද අහිමි වී තිබීම විශාල පාඩුවක් ලෙස විගණනයේදි නිරීක්ෂණය විය. | රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් අපේක්ෂා කළ පරිදි මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ අතර, මෙම ඉදිකිරීම් කාර්යයන් කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ඉදිකිරීම නිමකර රඟහල භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------- | ------------- |
| දෙපාර්තමේන්තුව සතු හෙක්ටයාර් 1.4157 ක් වූ ඉඩම් 04ක හිමිකම් සනාථ කිරීම සඳහා ලේඛන දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර ඉඩම් වල අයිතිය පවරා ගැනීමට පියවර ගෙන ද නොතිබුණි. | උතුරු දකුණු මිතුරු සෙවන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩමෙහි අයිතිය පවරා දෙන ලෙස ඉල්ලා 2023.04.27 දිනැතිව ප්‍රාදේශීය ලේකම්, මිහින්තලය වෙත ඉල්ලීමක් කර ඇත. අනෙකුත් ඉඩම් වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට අදාල රාජකාරී අවසන් වූ වහාම වත්කම් ගිණුම් තැබීමටත්, ඒ බව විගණනයට වාර්තා කිරීමටත් නියමිතව ඇත. | දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් වල අයිතිය පවරා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | -------------------------- | -------------- |
| මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වාවූ රෙගුලාසි හා 612 වැනි අධිකාරිය මතවූ රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් 52 ක් ඉකුත් වසරේ හඳුනාගෙන තිබුණද එම නිලධාරින් වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් ගේ අංක. CA/1/1/12/27/4(i) හා 2023.04.11 දිනැති ලිපිය මගින් ඇප අය කළ යුතු සීමා හා ක්‍රමවේද සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙම දින වල ඇප අයකිරීම් වලට අදාලව ඉතිරිකිරීම් ගිණුම් ආරම්භ කිරීමේ කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි සහ ඇප ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2011 වර්ෂයේ අනුමත කරන ලද අභ්‍යන්තර විගණක තනතුර පිරවීමට 2023 මැයි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයකු පත් කර දෙන ලෙස ඉල්ලා කිහිපවරක්ම ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, අංක. DCA/02/02 හා 2023.04.06 දිනැතිව නැවත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත. ඒ පිළිබඳව විගණනයට ද වාර්තා කර ඇත. | ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ 28 ක් වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 15 ක් එනම් සියයට 54 ක පුරප්පාඩු පැවතුණි. වසර ගණනාවක සිට පුරප්පාඩු වී පවතින ගණකාධිකාරි තනතුර ද මේ තුළ විය. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිළිබඳව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අංක. DCA/02/01/02-02 හා 2023.03.11 දිනයෙන් ද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත අංක. DCA/02/02 හා 2023.04.06 දිනයෙන් ඉල්ලීම් කර ඇත. මේ පිළිබඳව ද විගණනයට වාර්තා කර ඇත. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ අත්‍යාවශ්‍ය තනතුරු වල පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |